**සවුදි අරමුදලින් මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2020**

සවුදි අරමුදලින් මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මධ්‍යම, නැගෙනහිර, සබරගමුව, බස්නාහිර සහ වයඹ පළාත්වල මාර්ග කොටස් 06 ක කි.මී. 131.50 ක් ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 10,628 කට සමාන එ.ජ.ඩො. මිලියන 81.75 ක් වූ අතර ඉන් රු. මිලියන 7,800 කට සමාන එ.ජ.ඩො. මිලියන 60 ක් මූල්‍යයනය කිරීමට සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 ජුනි 03 දින ආරම්භ කර තිබුණු අතර 2020 අගෝස්තු 05 දින වන විට නිම කිරීමට නියමිතව තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.1 ඡේදනයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රීලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ඊට සම්බන්ධ පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

## 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 සහ 2015 දී රු. මිලියන 6,885.8 ක වියදමින් මාර්ග 6 ක ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර තිබුණද, ඒවා 2020 දෙසැම්බර් 31 දින වනවිටත් නිම කරන ලද වැඩවලට මාරු කර නොතිබුණි. | එම ව්‍යාපෘතිවල කෙරීගෙනයන වැඩ ශේෂය සිවිල් වැඩවලට මාරු කිරීමට 2021 මූල්‍ය ප්‍රකාශනවල කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 ට අනුකූලව වත්කම් හඳුනාගත යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන සහ මහා භාණ්ඩාගාරය විසින් පවත්වාගෙන යනු ලබන වාර්තාවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළ ණය මුදලින් මුළු අරමුදල් උපයෝජනය රු. මිලියන 368.74 කි. කෙසේ වෙතත්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තාවල අදාළ මුදල රු. මිලියන 194ක් ලෙස දක්වා තිබුණි. ඊට අමතරව, ණය යටතේ සටහන් කිරීම වෙනුවට රු. මිලියන 302.37 ක මුදලක් ලබාදිය හැකි විදේශ ආධාර ලෙස 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණි. එබැවින්, 2020 | ව්‍යාපෘතියේ සමස්ථ ගෙවීම් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ දක්වා ඇති ගෙවීම් සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවාර්තාවේ දක්වා ඇති ගෙවීම් සමඟ සැසඳීම සඳහා උපලේඛනයක් මූල්‍ය ප්‍රකාශන සමඟ සපයනු ලැබේ. | අදාළ පාර්ශව සමඟ සාකච්ඡා කර වෙනස්කම් අවම කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දෙසැම්බර් 31 දිනට ණය මුදල් උපයෝජනය මුල්‍ය ප්‍රකාශනවල නිසි ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 ට පටහැනිව, අත්පත් කරගත් ඉඩම් කට්ටි 1,356ක් සඳහා ප්‍රමාද පොලී ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන 2020 දෙසැම්බර් 31 දිනට සපයා නොතිබුණි. | සටහන් කරගත් අතර 2021 වර්ෂයේදී පොලී සඳහා ප්‍රතිපාදන ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 අනුව ප්‍රතිපාදන සැළසිය යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

## 3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| අංකය | සංරචකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | පාලම් ප්‍රතිසංස්කරණය සහ වැඩිදියුණු කිරීම | ඔරුගොඩවත්ත - අඹතලේ පාලම් අංක 6/2 පුළුල් කිරීමේ කටයුතු 2019 ඔක්තෝබර් 11 දින ආරම්භ කර 2021 සැප්තැම්බර් 12 දින නිම කිරීමට නියමිතව තිබුණි.කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 31 දිනට ඉලක්කගත සියයට 80 න් සියයට 26 ක ප්‍රගතියක් පමණක් ලබාගෙන තිබුණි. | කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන්,වැඩබිම වසා තිබුණු අතර වැඩ නොකෙරුණි. මීට අමතරව, ඉහත ප්‍රමාදය සඳහා දුරකථන සහ විදුලි රැහැන් කණුඉවත් කිරීමේ ප්‍රමාදයන් ද හේතුවිය. | ඉතිරි ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පාලම් ප්‍රතිසංස්කරණය සහ වැඩිදියුණු කිරීම | ඔරුගොඩවත්ත - අඹතලේ පාලම් අංක 6/1 පුළුල් කිරීමේ කටයුතු 2019 සැප්තැම්බර් 19 දින ආරම්භ කර 2021 මැයි 25 දින නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 31 දිනට සියයට 62 ක ප්‍රගතියක් පමණක් ලබාගෙන තිබුණි. | කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් වැඩබිම වසාදමා තිබුණි. මීට අමතරව, ඉහත ප්‍රමාදය සඳහා දුරකථන සහ විදුලි රැහැන් කණු ඉවත් කිරීමේ ප්‍රමාදයන් ද හේතුවිය. | ඉතිරි ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසි 4.2 උප වගන්තිය යටතේ දක්වා ඇති උපදෙස්වලට පටහැනිව, කොන්ත්‍රාත්කරුවන්ට කාර්ය සාධන ඇපකරය සැපයීමේ පිරිවැය අයකර ගැනීමට හැකිවන අයුරින් මාර්ග ප්‍රතිසංස්කරණ ප්‍රමාණ පත්‍රවල වෙනම ගෙවීම් අයිතමයක් ඇතුලත් කර තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්කරුවන් 04 දෙනෙකු විසින් ලබාගත් කාර්ය සාධන ඇපකරවල පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා රු. මිලියන 2.74 ක අතිරේක මුදලක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි. | කොන්ත්‍රාත් කොන්දේසිවලට අනුව, කොන්ත්‍රාත්කරු තම වියදමින් කාර්ය සාධන ඇපකරය සැපයිය යුතුය. කෙසේ වෙතත්, සාමාන්‍යයෙන් ප්‍රමාණ පත්‍ර අයිතමවල එය දක්වන අතර, එසේ නොමැති නම්, කොන්ත්‍රාත්කරුවන් මෙම පිරිවැය ප්‍රමාණපත්‍රයේ වෙනත් අයිතමවලට ඇතුළත් කිරීම/බෙදා හැරීම සිදුකරනු ඇත. | ලංසු ලේඛන නිකුත් කිරීමට පෙර ප්‍රසම්පාදන විශේෂඥ සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රමාණ පත්‍ර සමාලෝචනය කළ යුතුය. |
| (ආ) | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය 2012 වර්ෂයේදී ආරම්භ කළද, එම ක්‍රියාවලිය තවමත් සිදු වෙමින් පවතී. 2020 දෙසැම්බර් 31 දිනට ඉඩම් කට්ටි 1,449 ක් සඳහා වන්දි වශයෙන් රු.මිලියන 135.89 ක් සහ ඉඩම් කට්ටි 27ක් සඳහා ප්‍රමාද පොලිය ලෙස රු. මිලියන 7.8 ක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. තවද, ව්‍යාපෘතිය විසින් 2020 දෙසැම්බර් 31 දින වනවිට පවා ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 උප වගන්තිය අනුව මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ඉඩම් කැබලි කිසිවක් ලියාපදිංචි කර නොතිබුණි. | එකඟවෙමි. | වන්දි ගෙවීමට කඩිනම් පියවර ගත යුතු අතරජ් සඳහා වන අමතර වියදම් වළක්වා ගතයුතුය. |